කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර )-2015

2020 - අගෝස්තු

BCOME 1035 – මූල්‍ය ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 04

කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්ණ අංක 01

අ. මූල්‍ය ගිණුම්කරණය යන යෙදුම් පැහැදිලි කරන්න

(ලකුණු 02)

ආ කළමනාකරණ ගිණුම්කරණයට සාපේක්ෂව මූල්‍ය ගිණුම්කරණයේ වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ. ගිණුම්කරණ පරිසරයේ කොටස් පහ නම් කරන්න. ඒවායින් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඉ. අප්සරාගේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදුවී ඇත. එම එක් එක් ගනුදෙනුව පුළුල් කළ ගිණුම්කරණ සමීකරණයේ සටහන් කරන්න.

i. ප්‍රාග්ධනය රු. 10,000,000 ක් ආයෝජනය කිරීම.
ii. ව්‍යාපාරයට රු .3,000,000 ක ණයක් ලබා දී ඇත.
iii. බැංකු පොළිය ගෙවීම රු.5,500 කි.
iv. විකුණුම් වටිනාකම රු. 90,000 කි.
v. විකුණුම් පිරිවැය රු .70,000 කි.
vi. ව්‍යාපාරයේ අමතර ආදායම රු .24,000 කි.
vii. ගොඩනැගිලි කුලිය රු. 25,000 ගෙවන ලදී.
viii. රක්ෂණ ගාස්තු රු. 15,000 ගෙවන ලදී.
ix. කාර්යාල වියදම් රු .2,000 ගෙවන ලදී.
x. සේවක වැටුප රු .23,200 ගෙවන ලදී.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

ප්‍රශ්ණ අංක 02

අ. "දෙපාර්තමේන්තුව" සහ "ශාඛාව" යන යෙදුම් අතර වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු 02)

ආ. "ශාඛා" වර්ගීකරණය කර දක්වන්න.
(ලකුණු 03)

ඇ. පහත ගනුදෙනු ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛා පොත් වල වෙන වෙනම ගිණුම්ගත කරන්න.

i. ප්‍රධාන කාර්යාලයෙන් ශාඛාවට භාණ්ඩ යැවීම සහ ශාඛාවට භාණ්ඩ ලැබීම රු. 1,050,000
ii. ඉහත භාණ්ඩ වලින් රු. 61,000 ක් වටිනා භාණ්ඩ නැවත ප්‍රධාන කාර්යාලය වෙත හරවා යැවුණි.
iii. ශාඛා වියදම් ශාඛාව විසින්ම දැරීම රු. 53,000
iv. රු. 120,000 ක ශාඛා ගොඩනැගිලි කුලිය, ප්‍රධාන කාර්යාලය විසින් දැරීම.
v. ශාඛාව විසින් රු. 550,000 ක් වටිනා භාණ්ඩ තෙවන පාර්ශවයක් වෙතින් ණයට ගැනීම.
vi. ශාඛාව විසින් ණයට විකුණුම්, රු. 2,950,000
vii. ශාඛා ණයගැතියන් රු. 825,000 ක් ප්‍රධාන කාර්යලායට මුදල් පියවීම
viii. ශාඛාව විසින් මිලදී ගත් රු. 130,000 (ගැනුම්) මව් ශාඛාව විසින් ගෙවීම.
ix. ශාඛාව රු. 920,000 ක් වටිනා උපකරණ මිලදී ගැනීම
x. ශාඛාව විසින් රු. 560,000 ක් වටිනා ගෘහභාණ්ඩ ඔවුන්ගේ භාවිතය සඳහා මිලදී ගත් නමුත්, එම ගෘහභාණ්ඩ ගිණුම ප්‍රධාන කාර්යාලයේ පොත් වල ගිණුම් තැබීමට තීරණය විය.

(ලකුණු 20)
(මුළු ලකුණු 25)

ප්‍රශ්ණ අංක 03

අශානි සහ භාරත විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයේ 2019 මාර්තු 31 දිනට ශේෂ පත්‍රයේ උපුටා ගැනීමක් පහත දැක්වේ.

ශේෂ පත්‍ර ආකෘතිය

| | | | |
|---|---|---|---|
| ආයෝජන උච්චාවචන අරමුදල | 2,000 | ගොඩනැගිලි | 70,000 |
| සංචිත අරමුදල - අශානි | 20,000 | ආයෝජන | 20,000 |
| - භාරත | 20,000 | කීර්තිනාමය | 15,000 |
| අශානි - ණය | 10,000 | ණයගැතියෝ | 40,000 |
| භාරත - ණය | 20,000 | (-) අඩමාණ ණය වෙන් කිරීම | 4,000 |
| ණයහිමියෝ | 76,000 | තොගය | 10,000 |
| | | බැංකු මුදල් | 17,000 |

ඉහත ව්‍යාපාරය 2019, මාර්තු 31 දින විසුරුවා හැරීමට තීරණය වූ අතර පහත ගනුදෙනු සිදුවිය.

i. අශානි තම ණය පියවාගනිමින් රු. 8,000ක් වටිනා භාණ්ඩ අත්පත් කර ගත්තාය.

ii. භාරත විසින් ආයෝජන වලින් හරි අඩක්, 10% ක් අඩුවෙන් පවරා ගන්නා ලදී.

iii. ණයගැතියන් රු. 38,000 කට උපලබ්ධි විය.

iv. ණයහිමියන් රු. 380 ක් අඩුවෙන් පියවන ලදී

v. ගොඩනැගිලි රු. 130,000 කට උපලබ්ධි විය.

vi. කීර්තිනාමය රු. 12,000 කට තීරණය විය.

vii. ඉතිරි ආයෝජන මුදල රු.9,000 කට විකුණන ලදී.

viii. පොත්වල සටහන්ව නොතිබුණු යතුරු ලියනය භාරත විසින් රු.600 කට පවරා ගන්නා ලදී.

ix. උපලබ්ධි වියදම රු. 2,000 කි.

අවශ්‍ය වන්නේ,

අ. i. උපලබ්ධි ගිණුම

ii. හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම.

iii. බැංකු ගිණුම.

(ලකුණු 15)

ආ. පහත යෙදුම් කෙටියෙන් පැහැදිලි කරන්න.

i. මූල්‍ය ප්‍රකාශන වල සංරචක
ii. වත්කමක අවශේෂ අගය
iii. දේපල, පිරියත හා උපකරණ
iv. අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය
v. උපචිත සංකල්පය

(ලකුණු 02 x 05 =10)
(මුළු ලකුණු 25)

**ප්‍රශ්ණ අංක 04**

අජේ සහ විජේ හවුල් ව්‍යාපාරයේ ලාභ හා අලාභ අනුපාතය 3: 2 ක් වේ. 2019 මාර්තු 31 වන දින සංජේගේ ව්‍යාපාරය ඒකාබද්ධ කර නව හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය විය. ව්‍යාපාර දෙකේ ශේෂ පත්‍ර පහත පරිදි විය.

| වගකීම් | අජේ සහ විජේ (රු.) | සංජේ (රු.) | වත්කම් | අජේ සහ විජේ (රු.) | සංජේ (රු.) |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනය - අජේ | 100,000 | - | ගොඩනැගිලි පරිශ්‍රය | 80,000 | - |
| ප්‍රාග්ධනය - විජේ | 80,000 | - | ගෘහභාණ්ඩ | 24,000 | 15,000 |
| ප්‍රාග්ධනය - සංජේ | - | 60,000 | ආයෝජන | - | 30,000 |
| ජංගම ගිණුම් | | | තොගය | 60,000 | 45,000 |
| - අජේ | 34,000 | - | ණය ගැතියන් - අඩමාන ණය (24,000 – 2,000) | 22,000 | |
| | | | ණයගැතියෝ | | 18,000 |
| - විජේ | 28,000 | - | බැංකු | 82,000 | - |
| - සංජේ | - | 8,000 | | | |
| මහේෂ්ගෙන් ගත් ණය | - | 20,000 | | | |
| ණය හිමියන් | 26,000 | 16,000 | | | |
| බැංකු අයිරාව | - | 4,000 | | | |
| මුලු වටිනාකම | 268,000 | 180,000 | මුළු වටිනාකම | 268,000 | 180,000 |

ඒකාබද්ධ නව ව්‍යාපාරය AVS (පුද්ගලික) සමාගම ලෙස නම් කෙරුණි. එහි නව ප්‍රාග්ධනය වන රු. 400,000 සඳහා හවුල්කරුවන් විසින් නව ලාභාලාභ අනුපාතයට දායක වූ අතර, ඇතිවූ යම් වෙනසක් වී නම් ඔවුන්ගේ ජංගම ගිණුම් හරහා ගැලපීමට තීරණය විය.

මෙම සමාගම් දෙක පහත සඳහන් කොන්දේසි මත ඒකාබද්ධ කරන ලදී.

i. නව ලාභ අලාභ බෙදා ගැනීමේ අනුපාතය පහත පරිදි විය.

අජේ - 2/5

විජේ - 2/5

සංජේ - 1/5

ii. නව සමාගමේ පොත් වල කීර්තිනාමය සඳහා ගිණුමක් පවත්වා ගැනීමට තීරණය විය. එක් එක් සමාගමේ කීර්තිනාම අගයන් පහත පරිදි එකඟ විය.

අජේ සහ විජේ ව්‍යාපාරයෙන් - රු. 120,000

සංජේ ව්‍යාපාරයෙන් - රු. 40,000

iii. අපේ සහ විජේ ව්‍යාපාරයේ වත්කම් පහත පරිදි අගය කෙරුණි.

| | |
|---|---|
| ගොඩනැගිලි පරිශ්‍රය | - රු. 110,000 |
| ගෘහභාණ්ඩ | - රු. 21,000 |
| භාණ්ඩ තොගය | - රු. 69,000 |
| ණයගැතියන් | - රු. 23,200 |

iv. සංජේ ව්‍යාපාරයේ ආයෝජනය ඔහු රු. 46,000 කට විකුණා ඇති අතර එම මුදලෙන් ඔහු මශේෂ්ගේ ණය මුදල සහ බැංකු අයිරාව පියවා ඉතිරි මුදල නව හවුල් ව්‍යාපාරයට පවරා දෙන ලදී.

අවශ්‍ය වන්නේ,

අ. අපේ සහ විජේ ව්‍යාපාරයේ ලෙජර් ගිණුම්

(ලකුණු 10)

ආ. සංජේ ව්‍යාපාරයේ ලෙජර් ගිණුම්

(ලකුණු 10)

ඇ. නව හවුල් ව්‍යාපාරයේ (AVS Pvt Ltd) 2019 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය

(ලකුණු 05)

(මුළු ලකුණු 25)